AL/2017/43/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය II<br>கிறிஸ்தவம் II<br>Christianity II | 43 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස් :**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) වසර 70 ක විප්‍රවාස කාලය තුළ දුකින් කල් ගත කළ ජනතාවට දෙවියන් වහන්සේ විසින් දිවැසිවරුන් යවනු ලැබුවේ කුමක් සඳහා දැයි කරුණු **හතරකින්** පෙන්වා දෙන්න.
(ii) ද්විතීය සම්මත ග්‍රන්ථ අනුමත **නොකළ** සභා පියවරුන් **හතරදෙනෙකු** නම් කරන්න.
(iii) එසකියෙල් දිවැසිවරයා පෙන්වා දෙන පරිදි ප්‍රතිස්ථාපනය හේතු කොට ගෙන ජනතාව තුළ නව ජීවිතය පිළිබඳව බලාපොරොත්තු ඇති කරවන අංශ **හතරක්** සඳහන් කරන්න.
(iv) දොළොස්වන සියවසේ කිතුනු දේවවේදයේ හා කිතුනු සංස්කෘතියේ වර්ධනයට දායක වූ දේවවේදීන් **හතරදෙනෙකු** නම් කරන්න.
(v) ජේසු නිකාය පිළිබඳව ප්‍රධාන කරුණු **හතරක්** ලියන්න.
(ලකුණු 04 × 5 = 20 යි)

2. (i) යුදා සමාජය තුළ කාන්තාවන්ගේ, ළමුන්ගේ හා වහලුන්ගේ සමාජ තත්ත්වය පිළිබඳව කරුණු **හතරකින්** දක්වන්න.
(ii) නීරෝ පීඩන සමයේ රෝමයේ විසූ කිතු බැති ජනතාවගේ ආධ්‍යාත්මික සැනසීම සඳහා ශුද්ධ වූ මාක් සුවිශේෂය සම්පාදනය කර ඇති අයුරු කරුණු **හතරකින්** දක්වන්න.
(iii) ශුද්ධ වූ ජොහන් සුවිශේෂයට අනුව පිලාත් ඉදිරියේ දී සිදු කළ විනිශ්චයේ පියවර **හතරක්** සඳහන් කරන්න.
(iv) 16 වන සියවසේ යුරෝපයේ ඇති වූ ආගමික ප්‍රගමනයට හා නව ආගමික ව්‍යාපාර ඇතිවීම සඳහා හේතු වූ කරුණු **හතරක්** ලියන්න.
(v) පැවති දේවස්ථාන ක්‍රමය වෙනස් කළ ප්‍රතිසංස්කරණවාදියෙකු වූ ජෝන් කැල්වින් විසින් ගොඩනගන ලද දේවස්ථානවල **දක්නට නොලැබුණු** අංග **හතරක්** සඳහන් කරන්න.
(ලකුණු 04 × 5 = 20 යි)

3. (i) පෙරදිග කලාවක් වූ 'ICON' චිත්‍ර කලාවේ ලක්ෂණ **හතරක්** ලියන්න.
(ii) ශ්‍රී ලාංකීය කිතුනු සභා ඉතිහාසය හැදෑරීමේ වැදගත්කම පිළිබඳව කරුණු **හතරක්** ලියන්න.
(iii) කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටිස් නම් දේශ සංචාරකයාට අනුව මෙරට කිතුනු භක්තිකයන් සිටි බවට හඳුනාගෙන ඇති සාක්ෂි **හතරක්** ඉදිරිපත් කරන්න.
(iv) විජයබා කොල්ලයට සම්බන්ධ රාජ කුමාරවරුන් **තිදෙනා ද**, ඔවුන් තිදෙනා අතර බෙදා ගත් රාජධානිය ද නම් කරන්න.
(v) ලන්දේසි යුගයේ දී මහනුවර කතෝලික පූජාප්‍රසාදිවරුන් නොමැති වුව ද, කතෝලිකයන් ඔවුන්ගේ ආගම ධර්මය තුළ ජීවත් වූ බවට රොබට් නොක්ස් විසින් සඳහන් කර ඇති කරුණු **හතරක්** ලියන්න.
(ලකුණු 04 × 5 = 20 යි)

## II කොටස

4. (i) ස්වභාවධර්මය තුළින් ම දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාවට මිදීම ගෙන දීම මෝසෙස්තුමා මගින් සිදුවන ආකාරය පීඩා දහය පදනම් කරගෙන බයිබල් කතුවරයා පෙන්වා දෙන්නේ කෙසේ දැයි කරුණු **පහක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 10 යි)
(ii) ස්වභාවධර්මයේ සිදුවන සිදුවීම් තුළින් අද අපට මිදීම ලැබෙන බව ඔබ ලත් අත්දැකීමක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

5. (i) පෘතුගීසි යුගයේ දී ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ වර්ධනය සඳහා සභාවේ දායකත්වය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)
(ii) "විදේශීය දහමක් අදහන්නන් ලෙස අද කිතුනුවන් හඳුන්වනු ලැබුව ද, ලංකාවේ විවිධ අංශවල සංවර්ධනයට කිතුනු සභාවේ දායකත්වය ලැබී ඇත." මේ ප්‍රකාශය පිළිබඳව කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

[ දෙවැනි පිටුව බලන්න

www.artsapi.lk

**6.** (i) 'කාන්තාවන් පිළිබඳ කිතුනු චින්තනය' යන මැයෙන් පහත සඳහන් කරුණු යටතේ පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

(අ) කාන්තාවන් සම්බන්ධයෙන් සභා ඉගැන්වීම්

(ආ) පැරණි ගිවිසුමේ උත්පත්ති පොත තුළ කාන්තාවන්ගේ චරිත

(ඉ) නව ගිවිසුම තුළ ගැලවීමේ කාර්යයට දායක වූ උදාර කාන්තා චරිත

(ලකුණු 10 යි)

(ii) සමාජයේ පොදු යහපත සැලසීම සඳහා කිතුනු ඔබේ ක්‍රියාකාරිත්වය කෙසේ විය යුතු දැයි ශුද්ධ බයිබලයේ දැක්ම අනුව කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)

**7.** (i) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාව පලස්තීනයේ පාරිසරික සෞන්දර්ය හා සම්බන්ධ වන අයුරු සුභාරංචි පොත්වලින් උදාහරණ දක්වමින් කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ii) ශුද්ධ බයිබලීය දැක්ම හා බැඳුණු ස්වභාවධර්මය නම් දේව තිළිණය ගැන මෙනෙහි කිරීමේ දී ස්වභාවධර්මය ආරක්ෂා කිරීම පිළිබඳව අපට ඇති වගකීම කිතුනු දරුවකු වශයෙන් ඔබ ක්‍රියාවට නංවන ආකාරය කරුණු **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

**8.** (i) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති **හතරක්** සඳහන් කර, ඉන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ සහ ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ ධර්මදූත සේවය පිළිබඳව ඇගයීමක් කර, ඉන් වත්මන් සභාවට ගත හැකි ආදර්ශ **පහක්** දක්වන්න. (ලකුණු 10 යි)

***

www.artsapi.lk